# Living the LOTUS

Buddhism in Everyday Life

10 2019

VOL. 169


## Founder's Essay

## දෙගිඩියාවෙන් තොරව කඩිසර පුහුණුව

ඉතාම වැදගත් විභාගයක් ළංවන විට, 'විභාගය හොඳින් කරගන්න පුළුවන් වේවි' යන හැඟීම හා 'අයියෝ, විභාගය හොඳින් කරගන්න බැරිවේවි' යන බිය සහිත හැඟීම් 2 ක අතර ගැටුමක් ඇතිවේ. එක් වරක් සිතේ බිය ඇති වූ විට, තවතවත් බියෙන් වෙළියයි.

නිච්රෙන් ෂෝනින් තුමා විසින් 'ශරීර වශයෙන් වෙන් වූවත් එකම ආධ්‍යාත්මයකින් කටයුතු කරනවා නම්, සෑම දෙයක්ම හොඳින් සිදුවේ' ලෙස කියා දෙන්නා සේ, එක් කෙනෙකුගේ හදවත වුවද, ඒ ආකාරයේ හැඟීම් දෙකට බෙදන විට නිතරම තම හිත තුලම ගැටුම් ඇතිවී කිසිම දෙයක්ම නියමාකාරයෙන් කර ගැනීමට නොහැකිවේ.

එසේනම්, හැඟීම් අතර අරගලය නැතිකර ගැනීමට හැකිවෙන්නේ කෙසේද?

සුමෝ ක්‍රීඩාවේදී තම හිතේ බිය දුරු කර ගැනීමට නම් 'කඩිසර පුහුණුව හැර කිසිවක් නොමැත' සේ පවසයි.

තම උපරිමයෙන් කඩිසරව පුහුණු වූ බැවින් 'මේ දක්වා පුහුණුවීම් කල නිසා කිසිම ගැටළුවක් නැහැ' යන යහපත් මානසිකත්වයෙන් තමාට ආවේණික ආකාරයට සුමෝ ක්‍රීඩාවේ යෙදිය හැකිය.

*Kaiso zuikan* 9 පි. 214-215


**Living the Lotus**
**Vol. 169 (October 2019)**

Senior Editor: Koichi Saito
Editor: Kensuke Suzuki
Copy Editor: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by
Rissho Kosei-kai International,
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 / FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලී සිටියි.

*President's Message*

# ‘බුදුවරුන්ට’ ට පුද පූජා පැවැත්වීම



නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## මෙතරම් විශාල ‘බුදුවරු’ පිරිසක් සිටින්නේ මන්ද

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ‘විවරණ ලබා දීම’ නම් 6 වන පරිච්ඡේදය තුල ‘ඔබත් බුදු බවට පත්වන්නේය’ ලෙස බුදුන් වහන්සේ විසින් ශ්‍රාවකයනුත් බුදු බවට පත්වන බව තහවුරු කරමින් ‘විවරණ ලබාදීම’ ගැන නැවත නැවත සදහන් වේ. එම පරිච්ඡේදයේම බුදුන් වහන්සේ විසින් ‘මාගේ ශ්‍රාවක, මෙම මහා කාශ්‍යප ස්ථිවරයන් මතු අනාගත කාලයේ තිස් කෝටියක් බුදු වරයන් හමුවී, උන් වහන්සේලාට විවිධාකාර වු පුද පූජාවන් සිදුකර ගරු සත්කාර ස්තුති ප්‍රශංසා කරන්නේ’ ය ලෙසද ‘මහණෙනි, මතු අනාගත කාලයේ මේ මහා කත්‍යාන ස්ථිවර තෙම, අසු කෙළක් බුදුවරයන් වහන්සේලා හමුවී උන්වහන්සේලාට වන්දනාමාන කරන්නේය’ සේ නොයෙකුත් ශ්‍රාවකයන් විසින් බුදුවරුන්ට පූජා පවත්වමින්, ගෞරව කිරීමේ වැදගත්කම සවිස්තරාත්මකව පැහැදිලි කරයි.

එසේ වුවත්, ‘තිස් කෝටියක්’ හා ‘අසු කෙළක්’ ආදී ගණනය කළ නොහැකි ‘බුදුවරයන් වහන්සේලාට පූජා පැවැත්වීම’ සේ ඇසෙන විට, මෙය වෙනත් ලොවක කථාන්දරයක් දැයි සිතෙයි. තවද ‘මතු අනාගත කාලයේ’ ලෙස ඇති බැවින්, නැවත නැවත ඉපදෙමින් මියයමින් ඈත අනාගත කාලයක් තුල ගත කරන ජීවිතයේදි මෙසේ සිදුවන බව සදහන් වේ. එය ඉන්දියාවට ගැලපෙන ආකාරයට තිබුණද, සත්‍යය ලෙසම අපට ප්‍රායෝගිකව කිරීමට හැකි දෙයක් ලෙස නොසිතමි.

අපි සාමාන්‍යයෙන් සත්‍යාවබෝධය ලබාගත් අයටයි ‘බුදු’ හෝ ‘බුදුන් වහන්සේ’ ලෙස පවසන්නේ. එබැවින් ‘බුදුන්’ ලෙස පැවසුවිට අපට ප්‍රතිරූපනය වන්නේ ‘ශාක්‍යමුණි බුදුන් වහන්සේය’. එමනිසා ‘අසු කෙළක්’ ආදිය ලෙස බුදුන් වහන්සේලා ගැන පැවසුවත්, එයද අවබෝධ කර ගැනීමට අපහසු වේ.

තවද, බුදුන් වහන්සේ සත්‍යාවබෝධ ලබා ගැනීම දක්වා හමුවූ සියළුම පුද්ගලයන්, ධර්මය ඉගෙන ගත් අය වාගේම ධර්මය බෙදහැරීමේදී හමුවු පුද්ගලයන්ව ‘බුදුවරු’ ලෙස පිළිගැනීමෙන් ගෞරව කිරීමට පමණක් සීමාවීම තුල ඉහත සදහන් සූත්‍ර පාඨ වැකිය නිවැරදිව අවබෝධ නොවේ. එනම් අප කළ යුත්තේ, බුදුන් වහන්සේව අනුගමනය කරමින් අපිද එදිනෙද හමුවන සෑම පුද්ගලයෙකුම අපට නිවැරදි මඟ පෙන්වන ‘බුදුවරු’ ලෙස පිළිගැනීමයි, එවිට මෙම සූත්‍ර පාඨ වැකිය අපගේ එදිනෙද ජීවිතයට ලැබෙන ප්‍රායෝගික පුහුණුවක් සේ ශරීරයට බද්ධ වේ.

## 'පුද පූජා පැවැත්වීම' යනු ගෞරව දැක්වීමයි

ජපානයේ සෙන් බුදු දහමේ, රින්සයි නිකායේ රින්සයි ගිගෙන් සෙන් ගුරුතුමා විසින් අපි ඉදිරිපිට සිටින සෑම පුද්ගලයෙකුවම 'බුදු කෙනෙකු' ලෙස දැකිය යුතු ආකාරය ගැන මෙසේ සදහන් කර ඇත.

'බාහිරෙන් පෙනෙන බුදු කෙනෙකු පසු පස හඹායාම නතර කළ විට, ඔබලාද බුදුවරුන් වේ. මේ මොහොතේ මාගේ දෑස ඉදිරිපිට සිටින ඔබ සෑම දෙනාමද බුදුවරුන් වේ' යනුවෙනි.

තවද මේ ආකාරයටද තම සගයන්ට පැවසූහ, තම අභ්‍යන්තරය පිරිසිදු හදවතකින් හා බුද්ධ ශක්තියෙන් යුතු බව අවබෝධ කර ගන්නේ නම් තමා බුදු කෙනෙකි, තමාගේ ඉදිරියෙහි සිටින අයද බුදුවරුය. එසේම 'තමාට හමුවන සෑම දෙනාම බුදුවරුන්ය' සේ විශ්වාස කර, පිළිගෙන කටයුතු කළ යුතුය, යන්නයි.

සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්, මියගිය අයට දෑත් එකතු කර වන්දනා කලද, ජීවත්ව සිටින කෙනෙකුට දෑත් එක් කර වන්දනා කිරීමට අකමැතිය. මියගිය අය තුලද, ජීවත්ව සිටින අය තුලද බුද්ධ ශක්තිය තිබේ. එබැවින් තමා ඉදිරිපිට සිටිනා පුද්ගලයන්ට 'ගෞරව දැක්වීම' විශ්මය දනවන්නක් නොව සාමාන්‍ය දෙයකි.

එසේනම්, ප්‍රයෝගිකව අප කළ යුත්තේ කුමක්ද? බුදුන්ට කෘතවේදීත්වය පල කිරීමේ වැදගත්ම 'පුද පූජා ක්‍රමය' වන්නේ, ධර්මය ප්‍රායෝගිකව පුරුදු පුහුණු කිරීමයි. ප්‍රායෝගික පුහුණුව තුලින් ධර්මයේ සත්‍යතාව අවබෝධ කරගැනීමෙන් ධර්මය තම ශරීරයට බද්ධ කර ගැනීමට හැකිවේ. එනම් බුදු කෙනෙකු හා සමානව මෛත්‍රියෙන් හා කරුණාවෙන් එදිනෙද ජීවිතය ගත කිරීමය. තවත් සරළව පවසනව නම්, 'අන්‍යයන්ගේ දුක් කරදර අඩු වේවා, සතුට වැඩි වැඩියෙන් උදාවේවා' ලෙස ප්‍රාර්ථනා කරමින් අන්‍යයන්ට ගෞරව කිරීමය.

එය අප ඉදිරිපිට සිටින 'බුදුවරුන්' කෙරෙහි දක්වන පුද පූජාව වේ. වාගේම ධර්ම පුහුණුව හා ආධ්‍යාත්මික දියුණුව තුලින් ධර්මය අපට දේශනා කල බුදුන් වහන්සේ කෙරෙහි ද දක්වන කෘතවේදීත්වය හා ප්‍රාණාමයෙන් යුතු හැගීම කැටිවූ පුද පූජාවද වන්නේය. ඒ ආකාරයට ගෞරව දක්වමින් අන්‍යයන් ගැන සිතමින් අපි කටයුතු කරන්නේ නම්, ටිකෙන් ටික 'බුදුන්ට' සමීප වීමට හැකිවන්නේය.

රෙදි කැබල්ලක් උදහරණයට ගනිමු. එම රෙදි කැබැල්ල හැඩ දමා මැසූ විට ලස්සන පරිපූර්ණ ඇදුමක් නිර්මාණය කර ගැනීමට හැකිවේ. එසේම, අපි සියළුදෙනා සතුව බුද්ධ ශක්තිය නම් රෙදි කැබැල්ල තිබේ. එය මෛත්‍රියෙන් කරුණාවෙන් හා අන්‍යයන්ට ගෞරව කිරීමෙන් හැඩ කරගන්නේ නම් අපිටද පරිපූර්ණ වු බුදු බව ලබා ගැනීමට හැකිවන්නේය.

From *Kosei*, October 2019



# දුවගේ රෝගය තුලින් වටහාගත් සැබෑ සතුට



ජොසි මැනලෝ
හවායි ධර්ම ශාඛාව, ඇමෙරිකාව

ජුලි මස 27 වන දින, ඇමරිකාවට රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ ධර්ම ව්‍යාප්තිය සිදුවී 60 වන සංවත්සර ලාස්වේගාස් වලදී පැවැත්වූහ. එහිදී සාමාජිකයන් 4 දෙනෙකු තමන් ලැබූ 'ධර්මාවබෝධයේ කතන්දරයන්' ඉදිරිපත් කළහ. එම කථාවන් සැප්තැම්බර් හා ඔක්තොම්බර් මාසවලදී කොටස් 2 කට බෙද පලකරන්නෙමු.

අලෝහා, මගේ නම ජොසි මැනලෝ, මම පැමිණියේ හවායි ධර්ම ශාඛාවේ සිටයි.

මගේ අම්මා මීට වසර 40කට පමණ පෙර, මාගේ අක්කාගෙ ඇදුම රෝගය හේතුවෙන් රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයට බැඳින. ඉන්පසු සෑම ඉරිදම පැවැත්වූ වැඩසටහන්, හෝසා, තෙදොරි වලට ඉතා උනන්දුවෙන් සහභාගි විය.

මම එකිනෙකා සතුටින් බැඳී තිබූ පවුලක හැදී වැඩින. කිසිම අඩුපාඩුවක් නැතිව බාල කාලය ගත විය. උසස් පාසල් සිසුවෙක් බවට පත් වී වාහන පැදවීමට පටන් ගත් විට, වාහන පැදවීමට නොහැකි අම්මාට උදව් කිරීමට ඇති අවස්ථා වැඩිවිය. ධර්ම ශාඛාවේ වැඩසටහන් ඇතිවිට අම්මාවත් තව සාමාජිකයන්වත් වාහනයෙන් ධර්ම ශාඛාවට ගිහින් දැමීම අමාරු දෙයක් නොවුනත්, බැහැයි කීමටද ඉඩක් නොවීය. ධර්ම ශාඛාවේ විශාල සාමාජිකයන් පිරිසක් සමඟ සහ ඔවුන්ගෙ පවුලේ අය සමඟද හමු වී තිබිණ. ධර්ම ශාඛාවේ සියළුදෙනාගෙන් කරුණාව ලැබින. එහෙත් ඒ කාලයේ අම්මා වගේ උනන්දුවෙන් වැඩ කරන සාමාජිකයෙක් බවට පත්වීමට සිතා සිටියේ නැත.



ඇමෙරිකාවට ධර්ම ව්‍යාප්තියේ 60 වන සංවත්සර උත්සවයේදී ධර්මාවබෝධයේ කතන්දරය ඉදිරිපත් කරන ජොසි මැනලෝ මහත්මිය.

මම ධර්මයට නැඹුරු වීමට පෙළඹුනේ, ධර්ම ශාඛාවේ තරුණ කණ්ඩායමේ ක්‍රියකාරකම් වලට සහාභාගි වූ නිසයි. ඒ කාලෙයේ තරුණ කණ්ඩායමේ නායකයා අයිරින් ඔසකි සාන්ය. ඇය සෑම විටම, කරුණාවන්ත විය. ක්‍රමක් ක්‍රමයෙන් ධර්ම ශාඛාවට යාමට කැමැත්ත ඇතිවිය, ධර්ම ශාඛාවේ සියළුදෙනා යහළුවන් බවට පත්විය.

හෝසා වලට සහභාගීවීමේ සතුටත්, සූත්‍ර පිළිබඳ ඉගෙනීමේ සැසි තුලින් වඩා වෙනස් විධියට කරුණු කාරණා ගැන කල්පනා කිරීමට පෙළඹිණ.

ඉන් පසු මම විවාහ වී, යොෂිමි මාගේ ලොකු දුව ඉපදුනා. සෑම දවසක්ම දුක් කරදර තිබුනත්, විශේෂ ප්‍රශ්න නොමැතිව දවස් ගත විය. එසේ සිටින විට දුව යොෂිමිට වයස මාස 9 පිරුණ දවසේ, හදිසියේම ඇදුම රෝගය වැළඳිනි. එක් රාත්‍රියක මාගේ දුව යොෂිමිව ස්වසන යන්ත්‍ර යට සම්බන්ධ කලා. 'ඇයි මගේ දරුවාට මෙහෙම වුනේ' 'ධර්ම වැඩකටයුතු සිදුනොකරන, ධර්ම ශාඛාවටවත් නොයන අක්කාගේ දරුවා ලෙඩක් දුකක් නොමැතිව හොඳින් ඉන්නවා, ධර්ම ශාඛාවටත් යන, ධර්මය පුරුදු පුහුණු කරමින් සිටින මගේ දරුවාට ලෙඩ හැදෙන්නේ ඇයි. මාගේ වාසනාව කොහේ ගියාද' 'ගෙදර බුදුපිළිමයද තැන්පත් කර, ධර්ම ශාඛාවටත් යමින්, විවිධ වැඩසටහන් වලටද සහාභාගී වී හැම දෙයම සිඳුකලා. ඒ නිසා දුක් කරදර ඇති වෙන්නේ නැහැ කියා සිතා සිටියත්, ඇයි මාගේ දුව මේ වාගේ දුක් විඳින්නේ' යැයි මම, මගෙන්ම විමසමින් කටයුතු කල ආකාරය දැනටත් අමතක නැහැ.

ඒ අවස්ථාවේ, මට ලැබුන උපදෙස නම් 'ධර්ම පුහුණුව ජීවිතයට බද්ධ කරගෙන යන්නය'. වැඩිහිටියන් බවට පත් වී පවුලක් වූ පසුව, පවුලේ අය වෙනුවෙන් තමන් වෙනුවෙන් ධර්මය මනා ලෙස පුරුදු පුහුණු කිරීම කල යුතු කාලයක් විය. ඒ කාලයේ අපගේ පවුලේ අය ජීවිතයේ දුක පිළිබඳ අත්දැකීම් ලැබුවා. කවදාවත් විසඳ ගැනීමට නොහැකියි යන ප්‍රශ්නද කිහිපයක් තිබිණ. ඒ අවස්ථාවල මම උපදෙස් ලබා ගත්තා වාගේම අන් අයගේද සහය ලැබුනා. ධර්ම ශාඛාව පිරිසිදු කිරීමට ශ්‍රමයෙන්ද, මූල්‍යමය අතින්ද පරිත්‍යාග සිදුකලා, මුතුන් මිත්තන්ට පිං අනුමෝදන් කිරීම, මිච්බිකි සිදුකිරීමෙන් විශාල වශයෙන් ආශිර්වාදය ලැබින. එසේ සුදු කල විවිධ දේ වල අත්දැකීම්, ආශිර්වාදය තුළින්

ධර්මය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

එදෙස ආපසු හැරී බැලූ විට, දුවගේ ඇදුම රෝගය මාව ධර්ම මාර්ගයට ගැනීමට බුදුන් වහන්සේගෙන් ලැබුණු ආශිර්වාදයක් බව අවබෝධ විය. දුවගේ ඇදුම රෝගය මාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් බවට පත් විය. ඒ තුලින් මට සැබෑ සතුටේ අර්ථය වැටහින.

දැන්, මම තරුණ කණ්ඩායමේ නායකයන්ට උපදෙස ලබා දීම සිදුකරනවා .තරුණ අය සමඟ වැඩකිරීම තුළින්, ඔවුන් කුමන ප්‍රශ්ණ වලට මැදිවී සිටිනවාද යන්න දැන ගැනීමට හැකිවිය. මින් ඉදිරියටද තරුණයන්ට ධර්මයේ වටිනාකම කියා දෙමින්, ඔවුන්ට ධර්ම ධර්මය අවබෝධ කරවීමට හදවතින්ම උනන්දුවෙන් කටයුතු කරමි.

සියළුදෙනාටම බොහොම ස්තුතියි



# බුදුන් වහන්සේ සූදානම් කරදුන් විශේෂ සැලැස්ම

කෙවින් රොච්
ශාන්ත අන්තෝනි ප්‍රදේශයේ ධර්ම ශාඛාව, ඇමෙරිකාව

සියළුදෙනාගෙන්ම අවසරයි.

මීට අවුරුදු 10 කට පෙර, අද වාගේ දවසක ලාස් වේගස් වල පැවැත්වූ ඇමරිකාවට රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ ධර්ම ව්‍යාප්තිය සිදුවී 50 වන සංවත්සර දිනයට සතියකට පමණ පෙර මට පිළිකාවක් ඇති බවට සැක පල කරන බව වෛද්‍යවරයා පැවසුවා.

හදිසියේම ලැබූ මෙම රෝග විනිශ්චයට මම පුදුම විය, වැඩිදුර පරීක්ෂන වල ප්‍රතිපල වලට අනුව ලාස් වේගස් වල සැලැස්ම අවලංගු කිරීමට සිදුවන බවට, නකමුරා ධර්ම නායක තුමාට දැනුම් දුන්නා. එවිට එතුමා සිනාමුසු මුහුණින් 'ඔබ 50 වන සංවත්සරයට සහභාගී වීමේ සැලැස්ම වෙනස් කිරීමට වුවමනා නැහැ, ගෙදර ගොස් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 16 වන පරිච්ඡේදය සජ්ඣායනා කරන්න, එවිට බුදුන් වහන්සේ ඔබ වෙනුවෙන් විශේෂ සැලැස්මක් සකසා දේවි' යැයි කියා සිටියා.

බුදු දහම පුරුදු පුහුනු කරමින් සිටි මම බුදුන් වහන්සේ මොන වාගේ සැලැස්මක් සකසා දෙනවාද යන්න සිතාගැනීමට නොහැකිවිය. එම කාලයේ මා තුල බුද්ධ ශක්තිය ගැබ්වී තිබෙන බව ඉගෙන ගනිමින් සිටියත්, ධර්ම නායකයාගේ උපදේශයේ ගැබ්වූ ගැඹුරු අර්ථය වටහා ගැනීමට නොහැකි විය.

පරීක්ෂනයේ ප්‍රතිඵල වලින් මට ඇති රෝගය පිළිකාවක් නොවන බව හදුනාගත්තත්, නකමුරා ධර්ම නායක තුමා කියූ දේ සැබෑ අර්ථය වටහා ගැනීමට නොහැකි විය.. දැන් මට සිතන දෙයක් නම්, ධර්ම කොපමණ දැනගෙන සිටියද, නොයෙකුත් අත්දැකීම් ලබාගන්නේ නැතිව එම ධර්ම කරුණු අවබෝධ නොවන බවයි.

එම 50 වන සංවත්සරයෙන් පසුව නකමුරා ධර්ම නායක තුමා රාජකාරියෙන් විශ්‍රාම ගොස්, සියටල් ප්‍රදේශයට පදිංචියට ගියහ. එමනිසා ශාන්ත අන්තෝනි ප්‍රදේශයේ ධර්ම ශාඛාවේ සාමාජිකයන්ට ධර්ම නායකයෙකුගේ හිගයක් ඇතිවිය. නව ධර්ම නායකයෙකුගේ අවශ්‍යතාවය තිබුනත්, මට එයට ප්‍රතිචාර දැක්වීමට හැකියාවක් නොවීය. පිළිකාවක් නැති බව හදුනා ගත්තත් මරනයට ඇති බිය නිසා මම ධර්ම නායකයෙකු ලෙස රාජකාරි භාර ගැනීමට පැකිලුනා. මීව්බිකි, තෙදොරි සිදු කිරීමටද නොහැකි විය. ශාඛාව ගැන සාමාජිකයන්ගේ විශ්වාසයද නැතිවිය. එම නිසා මමද ධර්මය ඉගැන්වීමට ක්‍රමයක් සෙවීමට උත්සාහ නොකරන හදවතකට පත් විය. මේ ආකාරයට කටයුතු සිදු වුවහොත් නායකයෙකු නැතිව සාමාජිකයන් බිඳ වැටෙනවා. එසේ සිතමින්ද එම වගකීම මම භාරගත යුතුය යන්න සිතුවේ නැහැ. සාමාජිකයන් සංවිධානයෙන් ඈත් වෙමින් ටිකෙන් ටික ප්‍රමාණය අඩු වුනා. සාමාජිකයන්ගේ අඩු වීම දැක, මටත් වගකීමක් ඇති බව දැනී, වචන වලට පෙරළීමට නොහැකි බලාපොරොත්තු සුන්වූ හැඟීමකට පත් විය.

නමුත් සුන් වූ බලාපොරොත්තු මැද, මාගේ පුටුපසින් මාව දිරිමත් කරන හඩක් ඇසින. තවත් සාමාජිකයන් අහිමි කරගන්න බැහැ, මම වර්තමාන තත්වයට කුමක් හෝ කල යුතුයි සිතා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගැනීම ආරම්භ කලා. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගෙන යන විට, මාගේ ධර්ම පුහුණුව සිතට බද්ධ වෙමින් යන බව වැටහුනා. වැඩිකල් යන්නට මත්තෙන් සාමාජිකයන්, කණ්ඩායම් වලට බෙදා ධර්මය සාකච්ඡා කිරීමට අවස්ථාව සැකසුවා. ඉතා ඉක්මණින් කණ්ඩායම් වල සමගිය, එකමුතුකම වැඩි වී, සහභාගීවන සාමාජිකයන්ද වැඩි වී, ධර්ම නායකයෙකු නොසිටියත් අපිට උත්සහායෙන් ධර්මය ප්‍රචාරය කරගෙන යාමට හැකි මට්ටමකට පත් විය.

2013 වර්ෂයේ මම ධර්මාචාර්ය ලබාගෙන ධර්මය ඉගෙනගෙන කෝසෙයි කායි සංවිධානයේ ධර්ම වැඩසටහන් හොදින් කරන බවට ප්‍රතිඥා දුන්නා . ධර්ම



ඇමෙරිකාවට ධර්ම ව්‍යාප්තියේ 60 වන සංවත්සර උත්සවයේදී ධර්මාවබෝධයේ කතන්දරය ඉදිරිපත් කරන කෙවින් රොච් මහතා

නායක කෙනෙකු නොමැති වුවත් සාමාජිකයන්ට මඟ පෙන්වමින් ධර්ම ව්‍යාප්ත කටයුතු ඉදිරියට කරගෙන යාම සිදුකලා.

කෙසේ වෙතත්, ඉන්පසු අවුරුද්දේදී මාගේ ශරීරයේ පිළිකාවක් ඇතිබව සනාථ වුනා. ප්‍රතිකාර කලත් සම්පූර්ණ සුවයක් බලාපොරොත්තු විය නොහැකි පිළිකා තත්වයක් විය. මාස 4 ක් පමණ රසායනික චිකිත්සා ප්‍රතිකාර ලැබුවා. එය මට ධර්මය පිළිබඳ ඇස් පෑදී, ධර්මය තවත් ගැඹුරින් අවබෝධ කරගැනීමට හැකි අවස්ථාවක් විය. රසායනික චිකිත්සා ප්‍රතිකාර ලබමින් සිටින කාලයේ බිරිඳ මාගේ ලගින්ම සිටිමින්, මාගේ බිය නැතිකර දිරිමත් කලා. පොත් පතේ දැනුමෙන් ධර්මය අවබෝධ කර ගන්නවාට වඩා, ප්‍රායෝගිකව අත්දැකීමෙන් ධර්මය අවබෝධ කර ගැනීම වඩා අසීරු බව මෙම සිදුවීමෙන් වැටහිනි.

අන්තිම රසායනික චිකිත්සා ප්‍රතිකාර ලබමින් සිටින කාලයේ, නකමුරා ධර්ම නායකතුමා කියූ 'බුදුන් වහන්සේ ඔබ වෙනුවෙන් විශේෂ සැලැස්මක් සකස්කර දේවි' යන උපදේශයේ තේරුම හොඳින් අවබෝධ විය. 'මාගේ ජීවිතය කෙටියි, මාගේ පැවැත්ම සදකාලික නැති වුනත්, බුදුන් වහන්සේගේ ධර්මය ප්‍රචාරය කරනවා යන මගේ උත්සාහය කැපවීම සදකාලික බවයි. එනම් 'බුද්ධ ශක්තිය' මා තුල තිබෙනවා, මාගේ කොටසක් වී, මා තුල ක්‍රියාකරන බව වැටහී සෑම දෙයකම බුද්ධ ශක්තිය ගැබ්ව ඇති බව වැටහී ගියා.

ශාන්ත අන්තෝනි ධර්ම ශාඛාවේ සාමාජිකයන් ධර්ම මාර්ගයට ගැනීමට වසර 6 ක කාලයක් මම හොඳින් වැඩකරමින් පැමිණියා. මරණ බියෙන් නිදහස් වූ පසු, මාගේ හදවතේ සතුටක් ඇති වී, කාරුණික හදවතක් නිර්මාණය වන බව දැනින. එම හදවත අන් අයටද කියා දීමට මම තව තවත් කැපවීමෙන් කටයුතු කරමින්, එහි ප්‍රතිපලද ලබා ගැනීමට හැකිවුනා. නකමුරා ධර්ම නායක තුමා විශ්‍රාම ගොස් වසර 10 ගතවී නව ධර්ම නායක කෙනෙකු නොපැමිණියත්, අප ශාඛාව ඇමෙරිකාවේ රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන වලට ආදර්ශයක් බවට පත්වී තිබෙනවා. ශක්තිමත්ව වගේම න්‍යායශීලීව සාමාජිකයන් හොඳින් කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම ලස්සන ඩෝජෝවක්ද, සෑම දවසකම ධර්මයෙන් වර්ධනය වන සාමාජිකයන්, ධර්මය ඊළග පරම්පරාවටද කියා දීමට කැපවීමෙන් වැඩකරන බෝධිසත්වයන් බවට පත්වෙමින් සිටී.

මට, වැඩිපුරම සතුටක් ගෙන දෙන්නේ, සාමාජිකයන්ගේ අනාගතය ගැන සිතා බිය වීමට අවශ්‍ය නොවීමයි. මට තව ඇත්තේ ධර්මය පුරුදු පුහුණු වීම පමණි. 'පිළිකාවක් ඇති බව පිළිගැනීමට හැකි අයුරින් මම වෙනස් වී, එය මාගේ ශරීරයේ කොටසක්' යැයි සතුටෙන් බාරගැනීමට හැකිවිය.

'බුදුන් වහන්සේ මා වෙනුවෙන් විශේෂ සැලැස්මක් සකසා දුන්නා' එය පිළිබඳ හදවතින්ම තේරුම් ගැනීමට හැකිවීම, මා ලැබූ ඉතාම වැදගත් ඉගැන්වීමකි.

සියළු දෙනාටම බොහොමත්ම ස්තූතියි.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 11 වන පරිච්ඡේදය, ස්තූපයක් පොළොවෙන් මතුවී ඒම (පෙර කොටස)

මීට පෙර 'ධර්මාචාර්යවරයෙකු වන 10 වන පරිච්ඡේදයේදී' බුදුන් වහන්සේ විසින්, බුද්ධ පරිනිර්වාණයෙන් පසුව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කිරීමේදී හදවත පවත්වා ගත යුතු අයුරු හා නිවැරදිව ධර්මය දේශනා කරන්නාවූ අය ලබන අනිශංස පිළිබඳ දේශනා කලහ.

### ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේගේ දර්ශනය

එසේ දේශනා කර අවසන් වූ සැනින්, පොළෝ ගර්භයෙන් ඉතා විශාල සප්ත රත්නමය ස්තූපයක් මතුවී අහස මැද පිහිටා සිටියේය. එසේම, එම රත්නමය ස්තූපය තුලින් මහා කටහඬකින්, 'සාදු සාදු ශාක්‍යමුණි බුදුරජාණනි, සෑම සියළු සත්වයෙකුම සැනෙකින් සත්‍යාවබෝධය ලබාගත හැකි ප්‍රඥාවකින් හෙබි, සෑම සියළු සත්වයෙකුම බෝධිසත්ව මර්ගය වෙතට ළඟා කරවන කියාදීම් ඇතුලත්, මේ දක්වා බුදුවරුන් විසින් රහසක් සේ ආරක්ෂා කරගෙන පැමිණි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සියළු සත්වයා වෙනුවෙන් දේශනා කළ ව දූ ලහ. ශාක්‍යමුණි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සියළු දේ නිරවද්‍යය' සේ, ධර්මයේ නිරවද්‍යතාව දර්ශනය කලහ.

එම කටහඬ අසා සෑම දෙනාම ප්‍රීතියට පත්විය, එහි සිටි මහා ප්‍රතිභාන බෝධිසත්වයන් වහන්සේ 'කුමන කාරණයක් නිසා මෙම සප්ත රත්නමය ස්ථූප අභ්‍යන්තරයේ මෙබඳු ශබ්දයක් නිකුත් වන්නේද' යැයි විමසුහ. එවිට ශාක්‍යමුණි බුදුන් වහන්සේ 'මෙම සප්ත රත්නමය ස්ථූප රාජයා අභ්‍යන්තරයේ තථාගතයන් වහන්සේ කෙනෙකුගේ අංග සම්පූර්ණ ශරීරය ඇත්තේය' සේ පිලිතුරු දුන්හ.

### රත්නමය ස්ථූපය, බුද්ධ ශක්තියේ සංකේතයයි

මෙම වැකියේ අරුථ ඉතාමත් වැදගත්ය. තථාගතයන් වහන්සේ යනු 'යථාර්තය (තථාත) තුලින් පැමිණි ස්වරූපය (ගත)' වන නිසා, තථාගතයන් වහන්සේගේ සම්පූර්ණ ශරීරය ස්ථූපය තුල තිබෙනවා යනු 'යථාර්තයේ (තථාත) සම්පූර්ණ ස්වරූපය මෙහි වැඩ සිටිනවා' යන අරුතයි.

යථාර්තය යනු, මේ විශ්වයේ සෑම සියළුදෙයකම පැවැත්ම බවට පත්වන ධර්මයයි. වෙනත් අයුරකින් පවසනවා නම්, එය 'මූලධර්මය' වනවා සේම, 'පරම සත්‍යය' වේ. මනුෂ්‍යය ස්වරූපයට බද්ධ කරනවා නම්,



මනුෂ්‍යයන් තුල තිබෙන 'බුද්ධ ශක්තිය' වේ. ඒ අනුව මෙම ස්ථූපය 'බුද්ධ ශක්තියේ' සංකේතය වේ.

මෙම ස්ථූපය අහස් ගර්භයෙන් පහල වුවේ නැත, පොළෝ ගර්භයෙන් මතු වීමද ඉතා වැදගත් කරුණකි. 'අහස් ගර්භය' මනුෂ්‍ය ලෝකයට ඈතින් පිහිටා තිබෙන කල්පිත ලෝකය වේ. 'පොළෝ ගර්භය' මනුෂ්‍යයන්ට සමීප යථාර්තවාදි ලෝකය වේ. එසේම, බුද්ධ ශක්තිය යනු වෙනත් තැනකින් (අහස් ගර්භයෙන්) ලැබෙන දෙයක් නොව, යථාර්තවාදීව අප තුල තිබෙන (පොළෝ ගර්භයේ) දෙයක් නිසා එය ධාරණය කරගත යුතු බව පෙන්වාදෙයි.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ කියාදීම් තුල මෙම යථාර්තයට අනුකූලව සෑම දෙනාටම එක හා සමානව බුද්ධ ශක්තිය අවබෝධ කර, විදහා දැක්වීම තුලින් මේ ලෝකය දුකින් මුදවා ගනිමු ලෙස පෙන්වාදෙන බෝධිසත්ව චර්යයාවේ මාර්ගය අඩංගු වනවා සේම, නොයෙක් බුදුවරයන් වහන්සේලා විසින් ආරක්ෂා කල කියාදීම් වේ. එය බුදුන් වහන්සේ විසින් ප්‍රථම වතාවට මහා ශ්‍රාවකයන්ට දේශනා කරන ලද නිසා, කෘතවේදීත්වය ප්‍රකාශ කර අවසන් කල නොහැකි මනුෂ්‍ය වර්ගයාට සදහනිකව තිබෙන වැදගත්ම දේ වේ. එම නිසායි, බුද්ධ ශක්තියේ රත්නමය ස්ථූපය තුලින් එවැනි විශාල හඬක් ඇසෙන්නට වුවේය.

තවද බුදුන් වහන්සේ විසින්, 'රත්නමය ස්ථූපය තුල වැඩ සිටින ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ ඉතා දුරාතියේ සිට පෙරදිගින් වැඩම කළ බුදු කෙනෙකි. උන් වහන්සේගේ බෝධිසත්ව කාලයේදී, ''තමා බුදු බවට පත් වු පසු, මේ ලෝකයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා වන කාලයක් නම් එම ධර්මය ශ්‍රවණය කිරීමට රත්නමය ස්ථූපයක් තුලින් වැඩම කරමින්, එම ධර්මයේ සත්‍යතාව විදහා දක්වමින් වර්ණනා කරමි'' ලෙස අධිෂ්ඨානයක් තනාගත්හ. උන්වහන්සේ බුදු බවට පත්වු පසුත් ''මාහට වන්දනා කිරීමට සිතනවා නම්, එක් ස්ථූපයක් නිර්මානය කරන්න'' සේ අවසන් කැමැත්ත ප්‍රකාශ කලබව' සඳහන් කලහ.



ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ යනු, 'දුරාතියේ සිටම ගිණිකොන දිශාවේ වැඩම කළ බුදු කෙනෙකි' යන වදනින් පැහැදිලි වන පරිදි මේ ලෝකයට වැඩම කළ සත්‍ය ස්වරූපයකින් යුතු බුදුන් වහන්සේ කෙනෙකු නොවේ. 'යථාර්තයේ ස්වරූපය', 'සත්‍යතාවයේ නියම ස්වරූපය' ප්‍රභූතරත්න තථාගතයන් ලෙස හඳුන්වයි. නමුදු එකළ ශ්‍රාවකයන් එම කරුණ පිළිගැනොගත් බැවින්, තථාගත ලෙස මනුෂ්‍ය ස්වරූපයක් ආරෝපනය කළ බව බුදුන් වහන්සේ විසින් පැහැදිලි කර දුන්හ.

හැම විටම, ඕනෑම තැනක වෙනසක් නොමැතිව යථාර්තය පවති. මෙම විශ්වය බිහිවු කළ සිට හැම විටම, මේ විශ්වයේ කොතැනක ගියත් එම යථාර්තයේ වෙනසක් නොමැත. එම යථාර්තය නොයෙක් ස්වරූප තුලින් අප හමුවට පැමිණේ. එම එක් ස්වරූපයක් ලෙස ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ සංකේතවත් වේ. එබැවින් 'විශාල රත්න ප්‍රමාණයක් කැටිවු යථාර්තය' ලෙස නම් කරන ලදී.

ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ විසින් සඳහන් කළ 'ස්ථූපයක් නිර්මාණය කරන්න' යනු, 'සෑම සියළු දෙයකම බුද්ද ශක්තිය අවධි කරන්න' යැයි හඳුන්වයි. එය ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ (යථාර්තය) ට කරන්නා වු නියම පූජාවයි. මන්දයත්, යථාර්තය ලෙස සත්‍යතාව පිළිඹිබු වේ. සෑම සියළුදෙයකම බුද්ධ ශක්තිය අවධිවීම මේ ලොවට අවශ්‍ය නිසාය.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P104-P109

# ශරීර වශයෙන් වෙන්වුවත් එකම ආධ්‍යාත්මික හදවතකින් ධර්ම ව්‍යාප්තියට

ඔඑශිකි පෙරහැරේ මාසයත් උදාවිය. නමු මියෝහෝ රෙන්ගේ ක්යෝ ඔදයිමොකු තුලින් සියළුදෙනා සමඟ එකම හදවතකින් ධර්ම ව්‍යාප්තිය සඳහා නැවුම් වූ අධිෂ්ඨානයන් ගොඩනඟා ගන්නා කාලයයි වේ.

මේ මස නිච්කෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවුඩය තුල, විවරණ ලබාදීම පරිච්ඡේදයෙන් උපුටා ගත් කොටසක් ගැන සඳහන් විය. තමා හා තමා අවට සිටින සියළුම දෙනා බුදුවරු හා සමාන පුද්ගලයන් ලෙස පිළිගෙන, ඔවුනට ගෞරව කිරීමට හැකි වන්නේ ධර්මය ප්‍රායෝගිකව පුරුදු පුහුණු කිරීම තුලින් බව සඳහන් විය.

'එක් පුද්ගලයෙන් හෝ  වැඩියෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ දේශනා කරන නියම මානුෂීය ජීවන ගමන දැනගෙන, නියම සතුට ළඟාකර ගත යුතු' බව නිර්මාතෘ තුමාගේ ප්‍රාර්ථනය විය.

මේ මාසය තුලදී, එම නිර්මාතෘ තුමාගේ ප්‍රාර්ථනය අපගේ ප්‍රාර්ථනය බවට පත් කරගෙන, නියම ධර්ම පුහුණුව වන ධර්මය බෙදාහැරීමට උපරිම කැපවීමෙන් කටයුතු කරමු.

අපි එක් කෙනෙක්, එක් අයෙකුව ධර්ම මාර්ගයට ගනිමු.

රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා





We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: info@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 FAX: 1-650-359-6437
Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
2F Ikh Mandal building, Khurenbulag bag, Bayan-Undur sum,
Orkhon province, Mongolia

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**